# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2368/21 - 2024 ජනවාරි මස 24 වැනි බදාදා - 2024.01.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වන වගන්තිය සමග කියවිය යුතු 41 වන වගන්තිය යටතේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගය.

**හරීන් ප්‍රනාන්දු (පා. ම.),**
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය.

2024 ජනවාරි මස 23 වැනි දින,
කොළඹ දී ය.

**නියෝගය**

2016.10.27 හා අංක 1990/23 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශිත 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග සංශෝධනය කරමින් නිකුත් කර ඇති 2022.12.14 දිනැති හා අංක 2310/28 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* නියෝගවල 7 වන නියෝගයේ (xiv) ඡේදය ඉවත්කර පහත ඡේදය ආදේශ කරමින්, තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

7 (xiv) (ආ)

''ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනවල තේරීම් කමිටුව අවුරුදු දෙකක (02) කාල සීමාවකට පත් කිරීම සඳහා, අදාළ ජාතික ක්‍රීඩා සංගමය/සම්මේලනය තම ක්‍රීඩා සංගමයට/සම්මේලනයට අනුබද්ධ සියලුම සාමාජික ආයතන නිසි පරිදි දැනුවත්කොට නාම යෝජනා ලබාගෙන, විධායක කමිටු රැස්වීමක් මගින් වඩා සුදුසු සාමාජිකයින් දස දෙනෙකු (10) තෝරා ගැනීම කළ යුතු අතර, තෝරා ගන්නා ලද නාමයෝජනා ලේඛනය සහිත අයදුම්පත්‍ර ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ද පිටපතක් සහිතව ජාතික තේරීම් කමිටුව වෙත යොමු කිරීම, ජාතික තේරීම් කමිටුව විසින් එම නාමයෝජනා පිළිබඳව තම නිර්දේශිත කමිටු නාමලේඛනය අමාත්‍යාංශ ලේකම් මගින් අනුමැතිය සඳහා විෂයභාර අමාත්‍යවරයා වෙත යොමු කිරීම.''

EOG 01 - 0209

1A - G 41314 — 07 (2024/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*